කයිට්ස් ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය

1. මුල්‍ය ප්‍රකාශන

1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 12 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින සභාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශිය සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිනුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම

1.3.1 ගිණුම්කරණ ඌනතා

(i) මුල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා වත්කම්, ආදායම් සහ වියදම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මුල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වගකිම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| වැඩියෙන් දැක්විම් | - | - | 01 | 1,024,907 | - | - |
| අඩුවෙන් දැක්විම් | 01 | 6,600 | - | - | - | - |
| අත්හැරිම් | - | - | - | - | 01 | 3,492,276 |
| වර්ගීකරණ දෝෂ | 01 | 65,500 | - | - | - | - |

(ii) සභාව සතු වාහන තුනක වටිනාකම තක්සේරු කොට අවසාන ගිණුම්වල ඇතුලත් කර නොතිබුණි. ඒ හේතුකොට ගෙන මෝටර් රථ වටිනාකම එම ප්‍රමාණයෙන් ගිණුම් වල අඩුවෙන් දැක්විණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
---------------------------------------------

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම.
---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.52,342,600 ක් වූ ගණුදෙනු විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්
-----------------------

පහත සඳහන් නීති, රීති රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ 2002 අංක 14 දරන එකතු කළ අගය මත වූ බද්ද | - | සමාලෝචිත වර්ෂය තුලදි අයකරගත් රු.18,515 ක් වූ එකතු කළ අගය මත බදු මුදලක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බද්ද | - | සමාලෝචිත වර්ෂය තුලදි අයකරගත් රු.14,046 ක් වූ ජාතිය ගොඩනැගිමේ බදු මුදලක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| **1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති** | | |
| පරිච්ඡේදය 11 වගන්තිය 4 | - | තක්සේරු බදු ලේඛණයක් පවත්වා නොතිබු අතර සභාව විසින් තක්සේරු බදු අයකර නොතිබුණි. |
| පරිච්ඡේදය V වගන්තිය 120 | - | රු.580,693 ක් වූ අත්තිකාරම් පිළිබඳව ලේකම් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| මුදල් රෙගුලාසි 234 | - | මාස 06 කට අධික කාලයක් තුල මුදල් කර නොමැති රු.3,000 ක් වූ චෙක්පත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

| උතුරු පළාත් සභාවේ මුල්‍ය රීති | | |
|---|---|---|
| පරිච්ඡේදය 2<br>උපවගන්තිය 69.1 | - | අනතුරට ලක්ව තිබූ සභාවට අයත් අංක LG-8958 දරන පික්අප් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.391,256 ක් වැයකර තිබුණි. අනතුරට අදාල විස්තර විගණකාධිපති වෙත දක්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ<br>පරිශිෂ්ඨය - .19<br>වගන්තිය 9.3.1 | - | .1,100,250 ක් වූ අංක 252-6481 දරන රථයට සිදුකළ අළුත්වැඩියාවක් සඳහා පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.456,003 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,641,627 ක් විය.

### 2.2 මුල්‍ය පරිපාලනය

අයවැයගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර පිළිවෙලින් රු.4,190,608 ක හා රු.5,633,569 ක විචලනයක් විගණනයේදි නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම් පහක දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 17 | - | - |
| (ii) බදු කුලි | 2,142 | 1,553 | 25 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,023 | 364 | 4,616 |
| (iv)වෙනත් ආදායම් | 26,321 | 23,396 | 4,590 |

2.3.2 උසාවි දඩ මුදල්

--------------------

2012 හා 2013 වර්ෂ සඳහා උසාවි දඩ මුදල් වශයෙන් කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු රු.928,382 ක මුදල ගිණුම්ගතකර ඇති නමුත් මෙම වාර්තාවේ දින වනතුරුත් අයකිරීම් කර නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

-----------------

වර්ෂ 2006 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු රු.3,661,430 ක් වූ හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 ආදායම් පරිපාලනය

------------------------

වසර 10 ක කාලයක් තිස්සේ වරිපනම් හා බදු අයකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ද වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මුළු ආදායම් ප්‍රමාණයෙන් සියයට 87 ක් වූ ස්ථාවර තැන්පතු මත ලැබෙන පොලී ආදායමෙන් සභාවේ කටයුතු දිගින් දිගටම කරගෙන ගොස් තිබුණි.

2.4 අනුමැතියකින් තොර ගෙවීම්

-----------------------------------

වටිනාකම රු.1,242,500 ක් වූ අංක 252/6481 දරන පික්අප් රථය පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සහ වාහන අළුත්වැඩියා සඳහා ප්‍රතිපාදන නොමැතිව රු.1,100,250 ක් වියදම් කර සමාලෝචිත වර්ෂය තුලදී අළුත්වැඩියා කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

--------------------------------

2.5.1 වත්කම් උපයෝජනය

----------------------------

i. උතුරු පළාත් පුනරුත්ථාපන හා යලි ගොනැංවීමේ අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කරන ලද රු.600,000 ක් වටිනා සීසාන යන්ත්‍ර 4 ක් වසර 10 කට අධික කාලයක් තුල ලියාපදිංචි කිරීම බලපත්‍ර ලබා ගැනීම හා රක්ෂණ ආවරණ ලබා ගැනීම යන කටයුතු කිරීමෙන් තොරව පැවති බැව් විගණනයේදි නිරික්ෂණය විය.

ii. ඌන උපයෝජනය

--------------------------

සභාවට අයත් වාහන 12 ක් නිෂ්කාර්යව පැවති බැව් විගණනයේදි නිරික්ෂණය විය.

iii. සැතපුම් මානක නොමැති වාහන

---------------------------------------

වාහන 4 ක සැතපුම් මානක ක්‍රියා විරහිතව පැවති බැවින් ඒවායේ කිලෝමීටරයක් සඳහා ඉන්ධන දහනය විගණනයේ දි නිශ්චය කළ නොහැකි විය.

iv. වාහන අළුත්වැඩියා සඳහා වූ නිශ්චල වියදම්
---------------------------------------------------

වටිනාකම රු.1,245,500 ක් වූ අංක 252-6481 දරන රථය 1998 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී රු.1,100,250 ක පරිවැයකින් එය අළුත්වැඩියා කර තිබුණි. එනමුත් එය නැවතත් 2013 ජුලි 23 දින වනවිට අළුත්වැඩියා කිරිමට අවශ්‍ය වී රථ ගාලේ ගාල්කර තිබුණි. 2014 මාර්තු 31 දිනැති අංක 24 තීරණය පරිදි එය වෙන්දේසියේ විකිණීමට තිරණය කර ඇති බැවින් අළුත්වැඩියාව සඳහා දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------------

i. සභාව විසින් අයවැයගත අභ්‍යන්තර මාර්ග කටයුතු වර්ෂය මුලදී ආරම්භ කරනු වෙනුවට 2013 ඔක්තෝබර් 15 දින ආරම්භ කර තිබුණි. ඒ හේතුවෙන් රු.661,032 ක් සඳහා වූ කර්මාන්ත ඉදිරි වර්ෂයට ගෙනගොස් තිබුණි.

ii. මුළුමනින්ම අත්හැර දමන ලද ව්‍යාපෘති
---------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වටිනාකම රු.700,000 ක් වූ ව්‍යාපෘති 3 ක් මුළුමනින්ම අත්හැර දමා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා
----------------------------------

i. ප්‍රජා මධ්‍යස්ථාන නංවාලිම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් 2006-2010 කාල පරිච්ඡේදය තුලදී ලබා දී තිබු රු.142,000 ක් වූ පරිත්‍යාග ප්‍රජා මධ්‍යස්ථාන වලට ලබා දී නොතිබුණි. ඒ වෙනුවට එම මුදල් වෙනත් තැන්පතු යටතේ රඳවා තිබුණි.

ii. පුනරුත්ථාපන හා යලි ගොඩනැංවීම් කටයුතු සඳහා යාපනය දිසාපති විසින් 2002 වර්ෂයේදී ලබා දෙන ලද රු.110,925 ක මුදලක් එම කටයුතු සඳහා උපයෝගි කර නොගෙන වෙනත් තැන්පතු යටතේ රඳවා තිබුණි.

2.8 අවිධිමත් අරමුදල් භාවිතය
-----------------------------------

පැල්පත් නැති කිරිම සහ පානිය ජලය ලබාදිම සඳහා 2002 වර්ෂයේදී යාපනය දිසාපති විසින් රු.839,075 ක් වෙන්කරදී තිබුණි. සභාව විසින් ගනු ලැබූ තිරණයක් මත මෙය සමාලෝචිත වර්ෂය තුලදී බහළුම් ප්‍රතිසංස්කරණය සඳහා උපයෝජනය කර තිබුණි.

3. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) අයවැය
(ආ) ආදායම් රැස් කිරිම
(ඇ) වාහන උපයෝජනය
(ඈ) විවිධ තැන්පතු